# ඩිජිටල් අනන්‍යතා සොරකම්



කතාව සහ නිර්මාණය: පූර්ණිමා මීගම්මන

චිත්‍ර : මේව් ටෑන්

# ඩිජිටල් අනන්‍යතා සොරකම

## හැඳින්වීම

අනන්‍යතා සොරකම් අන්තර්ජාලයේ සහ ඉන් පිටත දී ද සිදුවිය හැක. යමෙකුගේ අවසරයකින් තොරව, ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම සහ අපරාධ ක්‍රියා සඳහා එම තොරතුරු භාවිතා කිරීම මීට අදාළ වේ. වෙනත් පුද්ගලයෙකුගේ ණයවරපත් (credit card) හෝ හරපත් (debit card) විස්තර භාවිතා කර, ඔවුන්ට අයත් නොවන මුදල් වියදම් කිරීම මීට උදාහරණයක් ලෙස දැක්විය හැක.

යමෙකුගේ අනන්‍යතාවය සොරකම් කළ හැකි ක්‍රම කිහිපයක් තිබේ, එක් ක්‍රමයක් වන්නේ තතුබෑම් (phishing) කිරීමයි. මෙම ක්‍රමය අපරාධකරුවන් විසින් යම්කිසි සංවිධාන (බැංකුවක් හෝ සමාගමක්) ලෙස පෙනී සිටී. සාමාන්‍යයෙන් මෙය සිදු කරනු ලබන්නේ පුද්ගලයන්ගෙන් විද්‍යුත් පණිවිඩ හෝ කෙටි පණිවිඩ හරහා පුද්ගලික මූල්‍ය තොරතුරු ඉල්ලා සිටීමෙනි.


CITY BANK
WELCOME
CITY BANK
check
100,000/=
තැඹිලි එන්ටර්ප්‍රයිසස්
K M තැඹිලි
Thambili@fruitmail.com
+94 7781 854 872
අද නම් මරු දවස.
සිටි බැංකුවෙන් දැනුම්දීමක්
රුපියල් 100,000.00 මුදලක් ඔබේ ගිණුමට බැර කර ඇත.
වර්තමාන ගිණුමේ ශේෂය රුපියල් 446,000.00
CITY BANK
WELCO


හිතවත් තැඹිලි මහතාණෙනි,
සුභ පැතුම්! ...
https://fruitmail.com/mail/inbox
හිතවත් තැඹිලි මහතාණෙනි,
සුභ පැතුම් !!!
විශ්වාසවන්ත ගූගල් ක්රෝම් පාරිභෝගිකයෙක් වන ඔබව ස්මාර්ට් ජංගම දුරකථනයක් තෑගි කිරීමට ඔබ අහඹු ලෙස තෝරාගෙන ඇත.
එම ත්‍යාගය ලබා ගැනීමට ඔබ තැපැල් ගාස්තු වන ඩොලර් 12.95 මුදල ගෙවිය යුතු වේ.
මෙතනින් ගෙවන්න: http://chromloyalty.com
ස්තුතියි,
ගූගල් ක්රෝම් ලෝයල්ටි කණ්ඩායම
ශා...
මම ෆෝන් එකක් දිනලා.
http://chromloyalty.com/Pay
CARD INFORMATION
Name on Card K.M Thambili
Card Number 4213 4785 6316 7531
CVV 231
Expiration Date 05/06/2020
SUBMIT
ක්ලික්
http://chromloyalty.com/Pay
ස්තුතියි.
ඔබගේ ගෙවීම සාර්ථකයි
අපි ඔබට ස්මාර්ට් ජංගම දුරකථනය හැකි ඉක්මනින් එවන්නෙමු.
යේ... ඔයාගේ සල්ලි ඔක්කොම දැන් මගේ.
හා හග් හා...


ALERT
CITY BANK
කොහොමද මේක උනේ?
මොකක්?
සිටි බැංකුවෙන් දැනුම්දීමක්
රුපියල් 446,000.00 මුදලක් ඔබේ ගිණුමෙන් හර කර ඇත.
වර්තමාන ගිණුමේ ශේෂය රුපියල් 0.00
අයියෝ!
තැඹිලි මහතා තතුබැම් ඊමේල් පණිවිඩයක් විශ්වාස කර ඔහුගේ පුද්ගලික තොරතුරු ලාබා දුන් නිසා ඉතිරි කළ මුදල් සියල්ලම ඔහුට නැති උනා.
අන්තර්ජාලයේ පුද්ගලික තොරතුරු ලාබා දීමේදී ප්‍රවේසම් වන්න.
මගේ සල්ලි ඔක්කොම කොහෙද ගියේ?

# උගත් පාඩම්

## තතුබෑම් (phishing) වලින් ආරක්ෂා වීමට උපදෙස්

- ඔබේ බැංකු තොරතුරු විමසන සැකකටයුතු වෙබ් අඩවිවලට ප්‍රවේශ වීමෙන් වළකින්න.

- කිසියම් සැක සහිත ගනුදෙනුවක් සිදු වී තිබේදැයි තහවුරු කරගැනීමට ඔබේ ණයවරපත් සහ බැංකු මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සැමවිටම දැඩි සැලකිල්ලක් යොමු කරන්න.

- මූල්‍ය ගනුදෙනු සඳහා ආරක්ෂිත වෙබ් අඩවි පමණක් භාවිතා කරන්න. මිල දී ගැනීමක් සඳහා ඔබේ ණයවරපත් තොරතුරු අන්තර්ජාලයේ ඇතුළත් කරන විට, සාමාන්‍යයෙන් නම් එම වෙබ් අඩවි තීරුවේ වම් කෙළවරේ අගුලක ලාංඡනයක් පෙනෙන්නට තිබිය යුතුයි. එවැන්නක් නොමැති නම්, ඔබේ තොරතුරු ඇතුළත් කිරීමෙන් වළකින්න.

- ඔබේ බැංකුව හෝ විශ්ව විද්‍යාලය වැනි පිළිගත් ආයතනවලින් යැයි කියමින් පුද්ගලික තොරතුරු ඉල්ලා සිටින විද්‍යුත් පණිවිඩවලට පිළිතුරු දීමෙන් වළකින්න. මෙම සැක සහිත විද්‍යුත් පණිවිඩ ගැන අදාළ ආයතනය අමතා තොරතුරු තහවුරු කරගන්න.

- සාමාන්‍ය සංවේදනය, දැනීම පාවිච්චි කරන්න. “පැරීසියට නොමිලේ සංචාරයක් දිනාගැනීම සඳහා ඔබේ ක්‍රෙඩිට් කාඩ් අංකය ඇතුළත් කරන්න!” වැනි අදහාගත නොහැකි දීමනාවක් හිමිවන බව පැවසෙන්නේ නම්, එය වංචාවක් වීම සඳහා ඉහළ සම්භාවිතාවක් තිබේ.

- පොදු වයිෆයි කලාපවල වයිෆයි පහසුකම් භාවිතා කරන විට පුද්ගලික තොරතුරු හුවමාරු ගැනීමෙන්වළකින්න. පොදු වයිෆයිවල ආරක්ෂාව අඩු අතර, ඒවා පහසුවෙන් "හැක්" කළ හැක.

- නෝර්ටන් ප්‍රති-වයිරස සමාගමෙන් හෝ එවැනි වෙනත් සමාගමකින් එවන ලද්දක් බව පවසමින්, යමක් බාගත කරගැනීම සඳහා ඔබව පොළඹවන විද්‍යුත් පණිවිඩ ගැන අවධානයෙන් සිටින්න. එම විද්‍යුත් පණිවිඩයට පිළිතුරු සැපයීම මඟහැර, ඔබම ඒ සමාගම හා සම්බන්ධ වී අදාළ තොරතුරුවල සත්‍ය අසත්‍ය බව සැක හැර දැනගන්න.